පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 9

දෙවන වාරය - ජූනි මස තෙවන සතිය

සැකසුම - එච්.ඒ සංජය උදය කුමාර

## සති පාසල කාර්ය පත්‍රිකාව

**පාඩම හෝ ඒකකය - විවිධ අවශ්‍යතා සඳහා ලේබල් නිර්මාණය කරමු.**

නිපුණතාව 4.0 : නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම 4.1 : විවිධ අවශ්‍යතා සඳහා පෝස්ටර් චිත්‍ර හා ලේබල් නිර්මාණය කරයි.

ලේබලයක් යනු භාණ්ඩ නිපදවන්නා හෝ අළෙවි සේවා නියෝජිතයකු විසින්, පාරිභෝගිකයාට/භාණ්ඩ මිලදී හෝ ලබා ගන්නාට, භාණ්ඩය පිළිබඳව දැනගැනීම පිණිස, අදාළ භාණ්ඩයේ ඇසුරුමේ සුදුසු ක්‍රමයකට ප්‍රදර්ශනය කරඇති, එම භාණ්ඩය පිළිබඳ තොරතුරු ඇතුළත් විධිමත්ව සැළසුම් කර සළකුණු කළ පත්‍රිකාව වේ.

### පෙර ඉගෙනුම් අවස්ථා/ ශිෂ්‍යා කළයුතු කාර්යන්

01. තම නිවසට වෙළඳ පොළෙන් රැගෙන එන විවිධ භාණ්ඩ ඇසුරුම් වල ඇති ලේබල් නිර්මාණය කර ඇති අන්දම, එහි අඩංගු වන මූලික දේවල් හොඳින් බලන්න.




02. ලේබල් නිර්මාණය කරණ අන්දම පිළිබඳ සැකසුන වීඩියෝ පට බලන්න. ඒ සඳහා පහත යූ ටියුබ් සබැඳි උදව් කර ගන්න.
    https://youtu.be/iKGZm5D0SrI

03. පහත සඳහන් පොත්පත් සොයා කියවන්න.
    චිත්‍ර කලාව 9 ශ්‍රේණිය -තිලකරත්න දිගන්වල මහතා- (පිටුව 69,70,71,72)

04. ලේබල් පිළිබඳව විකිපීඩියා ලිපි අන්තර්ජාලයෙන් කියවන්න https://en.wikipedia.org/wiki/Label

05. ලේබලයක් නිර්මාණයට අවශ්‍යය උපකරණ රැස්කර ගන්න.
    * ඩ්‍රෝවින් කඩදාසි * පිටපත් කරන ට්‍රේසින් කඩදාසි * ජ්‍යාමිතික උපකරණ * පැන්සල් * පෝස්ටර් සායම් හෝ දිය සායම් * පින්සල් * බහාලුමක්/ඇසුරුමක්

-


---

ලේබලයක් නිර්මාණයට පෙර සැලකිලිමත් විය යුතු දේවල් සහ හොද ලේබලයක පැවතිය යුතු ගුණාංග

01. අසුරණයේ ලේබලය අලවන ස්ථානයේ ප්‍රමාණයට හා හැඩයට ගැළපීම මෙන්ම ඇසුරුමට සුදුසු මාධ්‍යකින් නිර්මාණය කර තිබීම.
02. විස්තරාත්මක බව මෙන්ම සරළවීම සහ ලේබලයේ ඇති කරුණු පහසුවෙන් හා ඉක්මනින් තේරුම් ගත හැකි වීම.
03. උසස් සියුම් නිමාව, ආකර්ෂණීය මෙන්ම සිත්ගන්නා සුළු බව සහ ලේබලය ප්‍රචාරණය හා අළෙවිය සඳහා දායක වීම.
04. භාණ්ඩයේ ගති ලක්ෂණ වලට, යොදා ගත් මාධ්‍යට ගැළපීම සහ මුද්‍රණයට සුදුසු වීම.
05. ලේබලයක අඩංගු විය යුතු මූලික දේවල් ඇතුළත් වී තිබීම.
    (අ) නිෂ්පාදනයේ නාමය/ වෙළඳ නාමය, පෙළඹවීම සඳහා යොදා ගන්නා වැකි.
    (ආ) නිෂ්පාදනයට උචිත ඡායාරූප, චිත්‍ර හා මෝස්තර කොටස්, සළකුණු සංකේත, වෙළඳ ලකුණු ආදිය.
    (ඇ) නිෂ්පාදනයේ අඩංගු ද්‍රව්‍ය, ඇතුළත් දේවල් පිළිබඳව හා පරිභෝජනයේදී ලබාදෙන උපදෙස් ආදිය කෙටියෙන්.
    (ඈ) මිල,ප්‍රමිති තත්ත්වයන්, නිපදවූ හා කල්ඉකුත් වන දින, ප්‍රමාණ විස්තර, ඇසුරුම් කළයුතු හා බැහැරකළයුතු අන්දම.
    (ඉ) නිෂ්පාදකයාගේ විස්තර.
06. ලේබල් නිර්මාණය ග්‍රැෆික් සැළසුම් ගණයට අයත් වන බව.
    ග්‍රැෆික් සැළසුමක් යනු අක්ෂර. සංකේත රූප හා මුද්‍රා ලෙස අංග එකට එකතු වූ විචිත්‍ර ග්‍රාෆික සටහනකි. එහි සජීවී අජීවී හා සංකල්පීය වස්තු ඇතුළත් වේ. බොහෝ විට නිෂ්පාදන හා සේවා අවශ්‍යතා මත මේවා නිමවන අතර තේමාවට උචිත බව, මුද්‍රණයට සුදුසු බව විශේෂ ගුණාංගයෝ වෙති. එනිසා බොෝ විට පරිගණක මෘදුකාංග උපකාර කරගෙන ග්‍රැෆික් සැළසුම් නිර්මාණය කරනු ලබයි.
07. ලේබලයේ ස්වභාවය නිර්මාණශීලීව වෙනස් කල හැකි වීම - මෙහිදී දැනට ඔබ දැක ඇති ලේබලයක ආකෘතිය (චිත්‍ර මූලිකාංග තම අභිමතය පරිදි වෙනස් කර නිර්මාණයක් බිහිකල හැක. නැත්නම් අලුත්ම ආකෘතියකට ඔබගේ නව නිර්මාණයක් ලෙස ලේබලයක් සැලසුම් කල හැක.

ලේබලයක් ඇඳීමට අදහස් කිහිපයක්......

01 උදාහරණයක් ලෙස අපි පහන්තිර නිෂ්පාදන සඳහා පැකැට්ටුවකට සුදුසු ලේබලයක් නිර්මාණය කිරීමට චිත්‍ර අඳින කොළයක් ගෙන එහි අයිනේ පහත ආකාරයට රේඛා මගින් කොටුවක් ඇඳ ගන්න.



ගැටළුවක් - පහන්තිර පැකැට්ටුව කුඩාය. අපි එය ලොකු කොළයක අඳින්නේ ඇයි ලොකු කොළයක ඇඳ පසුව එම රූපය ස්කෑන් කර හෝ ඡායාරූප ගත කර පරිගණකයට ගෙන එහි මෘදුකාංග භාවිතයෙන් පහන්තිර පැකැට්ටුවේ ප්‍රමාණයට එහි උස පළල කුඩාකර මුද්‍රණය සඳහා යොමුකළ හැක.

කෙසේ වෙතත් පහන් තිර පැකැට්ටුවේ උස හා පළලට සම අනුපාතයකින් කොළයේ කොටුව ඇඳිය යුතුය. පහන්තිර පැකැට්ටුව අඟල් 2 හා 3 ප්‍රමාණය වේ නම් උස හා පළල 3 න් ගුණ කර අඟල් 6 හා 9 ලෙස කොටුවක් ඇඳ ගන්න.


02. ලේබලයේ නම අඳිමු.
    නම ඇඳීම සඳහා විවිධ අක්ෂර වර්ග විවිධ ආකාරයෙන් ඇඳිය හැක. මුලින්ම අවශ්‍ය ප්‍රමාණයට රේඛා දෙකක් ගසා ගැනීමෙන් එකම ප්‍රමාණයට අකුරු ඇඳීම සිදු කළ හැක.




පහන් තිර

පහන් තිර


03. පහන් තිරවල චිත්‍රයක් අඳිමු (අ) (ආ) (ඇ) (ඈ)



---

04.පහන් තිර වලට අමතරව අපි පහනක්ද ලේබලයට ඇතුලත් කරමු.

(අ) (ආ) (ඇ) (ඈ) (ඉ)



05.ඉහත වෙන වෙනම ඇඳගත් රේඛා හැඩතලයන් ට්‍රේසින් කඩදාසියකට පිටපත් කර අලුත් ඩ්‍රෝවින්/චිත්‍ර අඳින කඩදාසියක සුදුසු පරිදි වස්තු ස්ථානගත කර අඳින්න. පසුව වර්ණ යොදන්න.
    මෙම ලේබලය ඉතා සරළ එක් ඉදිරි පැත්තක ආදර්ශයක් පමණි. මෙහි ඇති මග හැරුණු තැන්, අඩුපාඩු හඳුනාගෙන නිවැරදි කර ගනිමින් ඉතා සාර්ථක නිර්මාණයක යෙදෙන්න. ඔබ මුල් පාඩම් වල ඉගෙන ගත් පාරිභාරික අවශ්‍යතා සඳහා ඇඳි භාණ්ඩ ඇඳීමේ කුසලතා මෙහිදී ප්‍රයෝජනයට ගත හැක.




ඉගෙනුම් පල

- ලේබලයක තිබිය යුතු මූලික අංග හඳුනා ගනිමින් විස්තර කරයි.
- අසුරනයේ හැඩය, යොදා ගත් මාධ්‍ය, භාවිත වන ස්ථානය අනුව ලේබලය නිර්මාණය කළ යුතු බව පැහැදිලි කරයි.
- තෝරා ගත් භාණ්ඩයේ ගති ලක්ෂණ අවබෝධ කර ගනිමින් උචිත ලේබලයක් නිර්මාණය කරයි.
- පාරිභෝගික ආකර්ෂණය සඳහා ලේබලයේ නිමාව වැදගත් වන බව ප්‍රකාශ කරයි.
- අන් අයගේ නිර්මාණ අවබෝධයෙන් යුතු විචාරයට ලක් කරයි.
- නිර්මාණ රස විඳියි.

### භාහිර ඉගෙනුම් අවස්ථා/සහායක ඉගෙනුම් ආධාරක/ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි දේ.

01. පොත්පත් - චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 9ශ්‍රේණිය (පිටුව 22,23)

02. යූ ටියුබ් සබැඳි - https://youtu.be/pUNTue1nWLY

03.ඊ නැණ පියස - https://www.enenapiyasa.lk/lms/course/view.php?id=1988

https://www.enenapiyasa.lk/lms/course/view.php?id=137

04. ඊ තකසලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=133

පහත ක්‍රියාකාරකම් වල යෙදෙන්න

01. ලේබලයක තිබිය යුතු ගුණාංග විස්තර කරන්න.

02. ඔබේම අනාගත නිෂ්පාදන යැයි සිතා උචිත ලේබල් අඳින්න.

(අ) පානීය ජල ඇසුරුම් බෝතලයකට (ආ) ළදරු සුවඳ කොලෝන ඇසුරුමකට (ඇ) පැණි බීම බොතලයකට

(ඈ) කුළුබඩු ඇසුරුමක මුහුණතෙහි ඇලවීමට